කල්මුණේ මහා නගර සභාවේ 2024
---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කල්මුණේ මහා නගර සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරිය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට කල්මුණේ මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.6.1(අ) හි සඳහන් නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
(අ)	2022 වර්ෂයේ වෙන්දේසියේ විකුණූ මූලධන වත්කම්වල පිරිවැය ගණනය නොකර එහි විකුණුම් වටිනාකම රු.200,420ක් ස්ථාවර වත්කම්වලින් අඩුකර තිබුණි.	එහි තොරතුරු ලැබුණු විට ඉදිරියේදී පිරිවැය අඩුකර දැක්වීමට පියවර ගනු ලබන බව.	ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ ජනාධිපතිවරයාගේ විශේෂ ව්‍යාපෘතිය යටතේ රු.4,806,654 කට ඉදිකළ නවපිටිමුනෙයි ළමා උද්‍යානය ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.	ඉදිරි මූල්‍ය වර්ෂයට එය ඇතුළත් කිරීමට පියවර ගනු ලබන බව.	-එම-
(ඇ)	ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් තැන්පතු සඳහා සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම් රු.3,500,663ක් ස්ථාවර වත්කම් ගිණුමට ඇතුළත් කර තිබුණි.	ස්ථාවර වත්කම්වල ඇතුළත් පොලී ආදායම මුදල් ගිණුමට මාරු කිරීමට පියවර ගෙන ඇති බව.	-එම-

1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
(අ)	2024 වර්ෂය සඳහා මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, එකතුව රු.635,312,683ක් වූ ගිණුම් විෂයන් 09ක් සඳහා තහවුරු කළ හැකි සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරි මූල්‍ය වර්ෂයේදී නිවැරදි කිරීමට පියවර ගන්නා බව.	කඩිනමින් තොරතුරු ලබා ගෙන නියමිත ලෙජර් ගිණුම් පවත්වා ගැනීමට පියවර ගත යුතුය.
(ආ)	මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව, 2024 දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂය රු.33,710,767 ක් වශයෙන් පැවැතුණි. මෙම ශේෂයට අදාල විස්තරාත්මක වර්ගීකරණ ලැයිස්තුව හා කාල විශ්ලේෂණය පවත්වා නොතිබුණි.	ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂය ලෙස දක්වා ඇති මුදල සඳහා සවිස්තරාත්මක විස්තර කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන බව.	තැන්පතු ශේෂය තහවුරු කරන විස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම

1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම්	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**මහා නගර සභා ආඥාපනතේ, 252 අධිකාරිය**			
	(i) 155 වගන්තිය	කල්මුණේ පොදු වෙළෙඳපොල ගොඩනැගිලි සංකීර්ණයේ පිහිටි කඩකාමර 588ක් සඳහා අයකරනු ලබන කඩකුලී වටිනාකම කාලීනව තක්සේරු කර කුලී මුදලක් අයකිරීමට පියවර ගෙන නොතිබුණි.	ඉදිරි කාලයේ තක්සේරු කර අළුතින් ගිවිසුම් අත්සන් කිරීමට පියවර ගන්නා බව.	ආඥාපනත ප්‍රකාරව, කඩකාමර සඳහා අයකරනු ලබන වටිනාකම කාලානුරූපීව තක්සේරු කිරීමට පියවර ගතයුතුය.
	(ii) 230 වගන්තිය	මහා නගර සභා බල ප්‍රදේශයේ රාජ්‍ය ආයතනවල ගොඩනැගිලි හා ඉඩම් තක්සේරු කර දේපළ බදු අයකිරීමට පියවර ගෙන නොතිබුණි.	ආගමික ස්ථාන හැර අනෙකුත් සියළුම ආයතන තක්සේරු කර ඇත. ඉදිරි කාලයේදී හිඟමුදල් අයකර ගැනීමට පියවර ගන්නා බව.	ආඥාපනත ප්‍රකාරව, රාජ්‍ය ආයතනවල ගොඩනැගිලි හා ඉඩම් තක්සේරු කර දේපළ බදු අය කිරීමට පියවර ගතයුතුය.
	(iii)247(ඇ) වගන්තිය	මහා නගර සභා බල ප්‍රදේශයේ ප්‍රසිද්ධ නොතාරිස් සේවාවන් සහ වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් වෘත්තීය බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි.	ඉදිරි කාලයේදී අයකිරීමට පියවර ගනු ලබන බව.	ආඥාපනත ප්‍රකාරව, සභා බල ප්‍රදේශයේ වෘතිතීය මධ්‍යස්ථානවලින් වෘත්තීය බලපත්‍ර ගාස්තු අයකර අයකර ගැනීමට පියවර ගත යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි **571(1),(2),(3)**	වර්ෂ දෙකක් ඉක්මවූ රු.4,622,507ක තැන්පතු අදාල පාර්ශවයන් වෙත ලබා දීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.	මේ සඳහා ක්‍රියාමාර්ග ගනු ලබන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව වර්ෂ දෙකක් ඉක්ම වූ කල් ඉකුත් තැන්පතු අදාල පාර්ශවයන්ට ආපසු ගෙවීමට හෝ ආදායමට

				මාරු කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 (iv) ඡේදය	නිවාඩු දින වැටුප් හා අතිකාල දීමනා ඇඟිලි සලකුණු යන්ත්‍ර සටහන් පදනම් කරමින් පැමිණීම තහවුරු කර ගෙවීම් කළයුතු බව සඳහන් වුවද, එයට අනුකූලව නොවී රු.331,756ක් ගෙවා තිබුණි.	මින් ඉදිරියට ඇඟිලි සලකුණු යන්ත්‍ර සටහන් පරීක්ෂා කිරීමට පියවර ගනු ලබන බව.	චක්‍රලේඛය ප්‍රකාරව, පරීක්ෂා කර ගෙවීම් සිදුකළ යුතුය.
(ඈ)	2021 අගෝස්තු 16 දිනැති අංක **PT/**03/2021 දරන නැගෙනහිර පළාත් චක්‍ර ලේඛය	මුදල්, ගබඩා භාණ්ඩ, රජයේ ආදායම් අයකිරීම් සහ චෙක්පත්වලට අත්සන් තැබීම් ආදි විෂයභාර නිලධාරීන් දස දෙනෙකුගෙන් ආරක්ෂිත ඇප තැන්පතු රු.107,500ක් මහානගර සභාව විසින් ලබාගෙන නොතිබුණි.	ඉදිරියේදී ආරක්ෂිත ඇප මුදල් ලබාගැනීමට පියවර ගනු ලබන බව.	චක්‍රලේඛ ප්‍රකාරව අදාළ නිලධාරීන්ගෙන් ආරක්ෂිත ඇප තැන්පතු ලබාගැනීමට පියවර ගත යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු.54,384,690 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.57,284,725ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව සභාව විසින් ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම රු.	බිල් කළ ආදායම රු.	රැස්කළ ආදායම රු.	දෙසැම්බර් 31 දිනට හිඟය රු.	ඇස්තමේන්තුගත ආදායම රු.	බිල් කළ ආදායම රු.	රැස්කළ ආදායම රු.	දෙසැම්බර් 31 දිනට හිඟය රු.
වරිපනම් හා බදු	73,600,000	281,930,057	22,226,082	259,703,975	198,100,000	249,180,580	20,905,649	228,274,930
කුලී	48,945,000	98,713,230	30,893,656	67,819,574	35,325,000	85,384,959	23,774,376	61,610,583
බලපත්‍ර ගාස්තු	21,410,000	8,409,300	8,409,300	-	19,972,500	8,416,456	8,416,456	-
වෙනත් ආදායම්	194,195,000	153,311,320	149,680,878	14,658,540	18,170,000	11,121,953	11,121,953	-
එකතුව	338,150,000	542,363,907	211,209,916	342,182,089	271,567,500	354,103,948	64,218,434	289,885,513

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණයන් පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව විසින් දේපළ බදු අයකිරීම කාලීනව යාවත්කාලීන නොකර 2012 වර්ෂයේ ඇස්තමේන්තුව පදනම් කරමින් සිදු කර තිබුණි. එසේම, බදු අයකිරීම සඳහා අවම ආදායම් පරීක්ෂකවරු සංඛ්‍යාවක් යොදවා තිබූ නමුත් ඔවුන්ට ආදායම් එකතු කිරීමේ ඉලක්ක ලබා නොදීම නිසා හිඟ ආදායම් අඛණ්ඩව විශාල වශයෙන් ඉහළ ගොස් තිබුණි.	ඉදිරියේදී තක්සේරු කිරීමට පියවර ගන්නා බව.	තක්සේරු කර ආදායම් ඉහළ නංවා ගැනීමට පියවර ගත යුතුය.
(ආ)	පොදු වෙළෙඳපොල කඩකාමර භූමි ප්‍රදේශයේ 11දෙනෙකු විසින් ඔවුන්ගේ ව්‍යාපාර පවත්වා තිබූ නමුත් සභාව විසින් එම පරිශ්‍රයට අදාල ඉඩමේ හිමිකාරිත්වය හා පැවැත්ම තහවුරු කිරීමට මේ දක්වා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මේ පිළිබඳව විධිමත් ක්‍රියාමාර්ග ගනු ලබන බව.	එම ඉඩමේ හිමිකාරිත්වය හා පැවැත්ම තහවුරු කිරීමට පියවර ගතයුතුය.
(ඇ)	බදු දී තිබූ වත්කම්වල බදු වටිනාකමින් සියයට 80ක් අනුමත බැංකු ඇපකරය ලබා ගැනීම සඳහා ගිවිසුමක් ඇති කරගෙන තිබූ නමුත්, එසේ කිරීමට අපොහොසත් වීම හේතුවෙන් රු.24,005,798 ක මුදලක් හිඟහිටිව පැවතුණි.	මෙවැනි දෝෂ ඉදිරියේදී නිවැරදි කිරීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	හිඟහිටි ආදායම් කඩිනමින් අයකර ගැනීමට පියවර ගත යුතුය.
(ඈ)	2021 වර්ෂයේ කල්මුණේ පොදු වෙළෙඳපොල සහ මාළු වෙළෙඳපොල බදුකුලී ගිවිසුම් සඳහා ලබාදුන් රු.5,600,000ක ව්‍යාජ සමුපකාර ග්‍රාමීය බැංකු ඇප සුරක්ෂණය සම්බන්ධයෙන් මේ දක්වා කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර ඇති බව.	නීතිමනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	**සත්ව ඝාතකාගාර**		
(i)	සභාව සතුව සත්ව ඝාතකාගාර නොමැති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පමණක් පුද්ගලික ඝාතකාගාරයේ සතුන් 9,706ක් ඝාතනය කිරීම නිසා රු.24,265,000ක් සභාවේ ආදායම් අහිමි වී තිබුණි.	මහා නගර සභාවට අයත් ඝාතකාගාරය ඉදිකිරීමට පියවර ගනු ලබන බව.	සත්ව ඝාතකාගාර ඉදිකිරීමට පියවර ගත යුතුය.

(ii)	මහානගර සභා ආඥාපනතේ 145(1) හා (2) වගන්ති ප්‍රකාරව, අනුමැතිය නොලත් පෞද්ගලික මස්කඩ තහනම් කිරීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර, මධ්‍යම පරිසර අධිකාරියේ පාරිසරික බලපත්‍ර ලබාගෙන නොතිබුණි.	පෞද්ගලික මස්කඩ තහනම් කිරීමට පියවර ගෙන ඇති අතර ම.ප. අධිකාරියේ බලපත්‍ර ලබාගැනීමටත් පියවර ගෙන ඇති බව.	නියමිත අනුමැතීන් ලබා මස්කඩ පවත්වාගෙන යා යුතු අතර පාරිසරික බලපත්‍ර ලබා ගැනීමට ද පියවර ගතයුතුය.
(ඊ)	**සන්නිවේදන කුළුණු කුලී**		
	සභා බලප්‍රදේශයේ සන්නිවේදන කුළුණු 33ක් ස්ථාපිත කර තිබූ නමුත්, සේවා සැපයුම්කරුවන්ගෙන් කිසිදු ආදායමක් අයකර නොතිබුණි. මෙමගින් වාර්ෂිකව ආසන්න වශයෙන් රු.200,000ක කුලී ආදායම් අහිමි වී තිබුණි.	ඉදිරියේදී අයකිරිමට පියවර ගනු ලබන බව.	සන්නිවේදන කුළුණු වලින් ආදායම් අයකර ගැනීමට පියවර ගත යුතුය.
(උ)	**දැන්වීම් පුවරු ගාස්තු**		
	දැන්වීම් පුවරු සඳහා විස්තරාත්මකව සෑම වර්ෂයක් වෙනුවෙන් වූ හිඟහිටි ආදායම් ගණනය කර නොතිබුණු අතර මහා නගර සභාව විසින් බල ප්‍රදේශයේ නව දැන්වීම් පුවරු, පවතින පුවරු හා අත්හැර තිබූ පුවරු පිළිබඳ විස්තර නඩත්තු කර නොතිබුණි.	-එම-	ලේඛන පවත්වා නිසි පරිදි ආදායම් අයකර ගැනීමට පියවර ගත යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

මහා නගර සභා ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 හඳුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
නැගෙනහිර පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ විගණන වාර්තාවට අනුව, මහානගර සභාව විසින් 2020 වර්ෂයේ ආදායම් මූලාශ්‍ර 09 කින් අයකර තිබූ රු.18,094,795ක මුදලක් තැන්පත් නොකර වංචා කර තිබුණි. එසේ වුවත්, මේ පිළිබඳ ඉදිරි ක්‍රියාමාර්ග මහා නගර සභාව විසින් ගෙන නොතිබුණි.	මහානගර සභාවේ මූල්‍ය අංශයේ සිදු වූ මූල්‍ය වංචාව සම්බන්ධයෙන් කල්මුණේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින බැවින් මේ පිළිබඳ ක්‍රියාමාර්ග අධිකරණය මාර්ගයෙන් සිදුකෙරෙන බව.	වංචාවට ඉඩ ප්‍රස්ථා සැලසූ පාර්ශවයන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගතයුතු අතර නඩු තීන්දුව ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වර්ෂ 05කට අධික කාලයක සිට අක්‍රීයව පැවත එන රු.3,729,844ක ජංගම බැංකු ගිණුම් ශේෂ ආදායම් ඉපැයීමේ මූලාශ්‍රවල යෙදවීමට පියවර ගෙන නොතිබුණි.	අක්‍රියව දීර්ඝ කාලයක සිට පවතින බැංකු බැංකු ගිණුම් 04 ක ශේෂයන් සභාවේ ප්‍රධාන ගිණුමට මාරු කිරීමට පියවර ගනිමින් පවතින බව.	ශේෂ ආදායම් ඉපැයීමේ මූලාශ්‍රවල යෙදවීමට පියවර ගත යුතුය.
(ආ)	සභාව විසින් මාණ්ඩලික නිලධාරීන් භාවිතා කරනු ලබන වාහන සඳහා කිසිදු රාජ්‍ය ලාංඡනයක් ප්‍රදර්ශනය කර නොතිබුණි. මෙමගින් වාහන අවභාවිතා කිරීමට ඇති අවස්ථා සලසා දී තිබුණි.	රජයේ ලාංඡන භාවිතා කිරීමට පියවර ගෙන ඇති බව.	සභාව සතු සියළුම වාහන වල රජයේ ලාංඡනය පින්තාරු කිරීමට පියවර ගත යුතුය.
(ඇ)	2023 වර්ෂයේදී සභාවේ සේවාවන් අන්තර්ජාලය හරහා ලබා ගැනීම වැඩිදියුණු කිරීම සඳහා රු.150,000ක වැයකර ස්ථාපිත කළ මෘදුකාංග යෙදුම (Software application) මේ දක්වා කිසිදු ක්‍රියාත්මක තත්ත්වයක නොපැවතුණ ද සමාලෝචිත වර්ෂය තුළද රු.150,000ක් ගෙවා එය අලුත් කර තිබුණි	මෙම මෘදුකාංග යෙදුම සම්බන්ධයෙන් පොදු ජනතාවට ප්‍රමාණවත් පැහැදිලිකමක් නොමැති නිසා, ඔවුන් සෘජුව පැමිණ අපගේ සේවාව ලබා ගනිති. එම නිසා මෙම යෙදුම භාවිතා නොකෙරුණු බව.	මෙම මෘදුකාංගය (Software) පිළිබඳව මහජනතාව දැනුවත් කර කාර්යක්ෂමව සේවාවන් ලබාදීමට පියවර ගත යුතුය.

3.3 නිෂ්කාර්/ ඌන උපයෝජිත වත්කම්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සභා බලප්‍රදේශයට අයත් පෙරියනීලවනෙයි පොහොර නිෂ්පාදන මධ්‍යස්ථානය පුළුල් කිරීමේ අරමුණින් කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ ඇඹරුම් යන්ත්‍රයක් රු.734,867 කට 2022 ජුනි 17 දින මිලදී ගෙන තිබුණු නමුත් එය භාවිතයට නොගෙන පැවැතුණි.	එය භාවිතයට ගත හැකි පරිදි පත් කිරීමට පියවර ගනිමින් පවතින බව.	එම යන්ත්‍රය භාවිතා කිරීමට පියවර ගත යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ සභාවට අයත් හා පරිහරණය කරනු ලබන ඉඩම්, ගොඩනැගිලි හා වාහන එකතුව 91ක වටිනාකම ප්‍රත්‍යාගණනය කර එහි තථ්‍ය වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.	වර්තමානයේ සියළුම දෑ සඳහා ප්‍රත්‍යාගණනය කිරීමට මූලික ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව.	ප්‍රත්‍යාගණනය කර තථ්‍ය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට පියවර ගතයුතුය.
(ආ)	සභාව සතු භාවිතා කළ නොහැකි වාහන 14 ක් අළුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසි කිරීමට ක්‍රියාමාර්ග නොගෙන අනාරක්ෂිතව පැවැතුණි.	මේ සඳහා වෙනම කමිටුවක් ස්ථාපිත කර විශේෂ භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර ඒවා අළුත්වැඩියාවට හෝ විකිණීමට කටයුතු කිරීමට නියමිත බව.	වාහන අළුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට කඩිනම් පියවර ගතයුතුය.
(ඇ)	සභාවේ භාවිතයේ පවතින වාහන 30ක අයිතිය මේ දක්වා මහානගර සභාවේ නමට පවරා ගැනීමට පියවර ගෙන නොතිබුණි.	වාහන පවරා ගැනීමට ක්‍රියාමාර්ග ගනු ලබන බව.	වාහනවල හිමිකාරිත්වය සභාවට මාරුකර ගැනීමට පියවර ගතයුතුය.

3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
(අ)	ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන චක්‍රලේඛය ප්‍රකාරව, මහා නගර සභාව විසින් විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.	මහා නගර සභාවට විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඉදිරිපත් කරනු ලබන බව.	චක්‍රලේඛ ප්‍රකාරව, ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට පියවර ගතයුතුය.
(ආ)	වටිනාකම රු.4,982,373ක් වූ වායු සමීකරණ(AC) 18 ක් පුද්ගලික සමාගමකින් මිලදී ගෙන ගබඩාවේ තබා තිබුණි. එම මිලදී ගැනීම් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණි.	මෙම වායු සමීකරණ මිලදී ගැනීම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටු තීරණයේ ගැටළු පැවැතුණද, වර්තමානයේ එය නිවැරදි කර ඇති බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව, මිලදී ගැනීම් සිදුකර ගබඩා ලේඛනයේ ලේඛනගත කිරීමට පියවර ගතයුතු අතර කඩිනමින් එම උපකරණ භාවිතා කිරීමට පියවර ගත යුතුය.

3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
(අ)	**කල්මුණේ වෙරළ උද්‍යානය ඉදිකිරීම**		
	අයිතම 28 කට අදාළව පස් පිරවීම හා තැලීම සඳහා මීටර් කියුබ් 15.20 ඇස්තමේන්තු කර තිබූ නමුත් මීටර් කියුබ් 3.16 පමණක් ඉටුකර තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් භූමි ප්‍රදේශය සමතලා නොකර හා අසංයුක්තවත් පැවැති තත්ත්වයක් ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අනාවරණය විය.	මතුපිටට මුහුදු පස් යෙදීමට තීරණය කර තිබුණි. පස් නොලැබීම හේතුවෙන් විකල්ප ක්‍රියාමාර්ග ගෙන තිබූ බව.	ඇස්තමේන්තු වාර්තාවට අනුව, නියමිත ප්‍රමිතීන් සපුරාලීමට පියවර ගත යුතුය. ඌනතාවයන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ) (i)	නට්පිට්ටිමුනෙයිහි ඉදිකළ ළමා උද්‍යානයේ පස් පිරවීම හා තැලීම සඳහා රෝලට රු.766,244ක් ගෙවීම් කර ඇතත් අදාල පස් පිරවීම හා තැලීම සිදු නොකර පැවැතුණු බව නිරීක්ෂණය විය.	කොටසකට ගෙවීම් සිදු කිරීමේදී පස්වල සංයුතිය අඩු කිරීමෙන් පසු අදාල ගෙවීම සිදු කර තිබූ බව.	-එම-
(ii)	BOQ අයිතම අංක 02 හා 03 සෙල්ලම් උපකරණ සැපයීමට හා සිවිකිරීම සඳහා රු.1,943,000ක් ගෙවා තිබුණු අතර එම උපකරණ ප්‍රමිතියෙන් තොර බව මහජනතාව විසින් ප්‍රතික්ෂේප කර තිබීමෙන් ඒ සඳහා කිසිදු විසඳුමකින් තොරව අසල පිහිටි පාසල් පරිශ්‍රයක තබා තිබුණි.	ක්‍රීඩා උපකරණ වර්ෂ 30 ක පළපුරුද්දක් ඇති ආයතනයකින් වර්ෂ 03 ක වගකීමක් සහිත මිලදී ගෙන තිබූ බව.	ගුණාත්මක හා දීර්ඝ කාලයක් භාවිතා කළ හැකි උපකරණ මිලදී ගැනීමට පියවර ගත යුතු අතර අක්‍රමිකතාවයන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

3.7 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
(අ)	සභාවේ ප්‍රධාන තනතුරු වන කොමසාරිස්, වෛද්‍ය නිලධාරී, නීති නිලධාරී, තාක්ෂණික නිලධාරී (විශේෂ), පරිවර්තක, ගිනි නිවීමේ යාන්ත්‍රික නිලධාරී, මහජන සෞඛ්‍ය පරීක්ෂක සහ ආදායම් පරීක්ෂක නිලධාරී සඳහා ස්ථිර නිලධාරීන් බඳවා නොගැනීම හේතුවෙන් මහා නගර සභාවේ මෙහෙයුම් කටයුතු අකාර්යක්ෂම තත්ත්වයක පැවැතුණි.	මේ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්වරයාට කිහිප වතාවක් පැහැදිලි කර ඇතත්, මේ දක්වා කිසිදු ඵලදායී ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු බව.	සුදුසු කාර්ය මණ්ඩලය පත් කිරීමට පියවර ගෙන සභාවේ කටයුතු කාර්යක්ෂම කළ යුතුය.
(ආ)	නිලධාරීන්ගෙන් පස් දෙනෙකුගෙන් අයවිය යුතු රු.360,159 ක ණය ශේෂ අදාළ පුද්ගලයින්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගෙන නොතිබුණි.	අදාල පුද්ගලයින් සහ ඇපකරුවන් හඳුනා ගෙන අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව.	ණය ශේෂය අදාල පුද්ගලයින්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	වාහන යාන්ත්‍රික තාක්ෂණික නිලධාරී තනතුර අනුමත කර තිබූ නමුත්, මේ දක්වා පත් කර නොමැති බැවින්, සභාවේ ධාවනය කළ නොහැකිව පවතින වාහන 14 ක් කඩිනමින්	වාහන යාන්ත්‍රික තාක්ෂණික නිලධාරී තනතුරට පත් කිරීම සඳහා ලිපිලේඛන සැකසීමට නැගෙනහිර පළාත් ප්‍රධාන	සුදුසු කාර්ය මණ්ඩලය පත් කිරීමට පියවර ගෙන සභාවේ කාර්යයන් විධිමත් කළ යුතුය.

අලුත්වැඩියා කිරීම සඳහා නිර්දේශ ලබා ගැනීමට නොහැකි වී තිබුණු අතර වාහන අලුත්වැඩියාවන්ට සම්බන්ධ නොවන ගොඩනැගිලි ඉංජිනේරුවරයා විසින් නිර්දේශ කිරීමේ ක්‍රියාවලිය අනුගමනය කර තිබුණි.	ලේකම්වරයාගෙන් ඉල්ලීම් කිරීමට පියවර ගෙන ඇති බව.	

(ඇ)

සමාලෝචිත වර්ෂයේ කඩකාමර කුලී ආදායම රු.23,967,812ක් හිඟහිටිව පැවැතුණ අතර අනුමත ආදායම් පරීක්ෂක තනතුරු 09ක් පැවැති නමුත් ඉන් 03ක් පමණක් මේ දක්වා පත්කර තිබුණු බව නිරීක්ෂණය විය.	කාර්ය මණ්ඩලය ඉල්ලීම් කර අනුයුක්ත කර ඇති බව.	කාර්යය මණ්ඩල පුරප්පාඩු සඳහා බඳවාගෙන අයකර ගතයුතු ආදායම් කඩිනමින් අයකර ගැනීමට පියවර ගතයුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 15 (1) වගන්තිය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන රජයේ සෑම මූල්‍ය වර්ෂයක් අවසාන වී මාස 03ක් ඇතුළත විගණනයට ඉදිරිපත් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට 2025 මැයි 08 දිනය දක්වා ප්‍රමාද වී තිබුණි.	ඉදිරි කාලයේ නියමිත දින තුළ සකස් කර ඉදිරිපත් කරනු ලබන බව.	ජාතික විගණන පනත ප්‍රකාරව, නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට පියවර ගතයුතුය.

4.2 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණනය මගින් ආයතන මෙහෙයුම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය සහ කාර්යාසාධනය ඉහළ නැංවීම සඳහා නිර්දේශ සකස් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන කමිටුවක් ප්‍රවර්තන වර්ෂය වෙනුවෙන් ස්ථාපනය කර ඇති බව සහ අභ්‍යන්තර විගණන සැලැස්මක් ද සකස් කර ඇති බව.	අභ්‍යන්තර විගණනය සිදුකර සභාවේ මෙහෙයුම් ප්‍රවර්ධනය කිරීම සඳහාත් කාර්යාසාධනය ඉහළ නැංවීම සඳහාත් නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.

4.3 තිරසාර සංවධර්න අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සංවර්ධන අරමුණු හඳුනා ගැනීමටත්, මැනීම සඳහා දර්ශක ස්ථාපිත කිරීමටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය සැලැස්මේ තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණි.	අයවැය සැලැස්මේ ඉහත කටයුතු සඳහා සභාව විසින් ප්‍රතිපාදන සලසා තිබූ අරමුදල් තිරසාර සංවර්ධන අරමුණු ඇතුළත් වන පරිදි සිදුකර තිබූ බව.	චක්‍රලේඛ ප්‍රකාරව ඉලක්ක සපුරා ගත හැකි වන පරිදි දර්ශක ස්ථාපිත කර අයවැයෙන් ප්‍රතිපාදන සලසා ගැනීමට පියවර ගත යුතුය.